**මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව**

------------------------------------------------------------

1 මූල්‍ය ප්‍රකාශන

---------------

1.1 මතය

-------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර, 2010 දෙසැම්බර් 31 දිනට මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූල ව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------

1.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත

-------------------------------

පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) දැනට භාවිතයේ පවතින රු. 1,675,436 ක් පිරිවැය වූ හා 2010 දෙසැම්බර් 31 දිනට ධාරණ අගය ශූන්‍ය ව පැවැති වත්කම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 18 අනුව ප්‍රත්‍යාගණනය කර ගිණුම් ගත කර නො තිබුණි. මේ සම්බන්ධයෙන් 2005 වර්ෂයේ ඉදිරිපත් කළ විගණන නිරීක්ෂණවලට පිළිතුරු ලෙස 2010 වර්ෂය තුළ දී එම ප්‍රමිතයට අනුකූල ව කටයුතු කරන බවට පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව වෙත 2010 නොවැම්බර් 25 දින දී රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් දන්වා තිබුණි.

(ආ) රජයේ ප්‍රාග්ධන ප්‍රදාන ලෙස සභාව වෙත ලැබී තිබුණු රු. 4,221,040 ක් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 24 ප්‍රකාර ගිණුම් ගත කර නො තිබුණි.

1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

වර්ෂය තුල ගෙවනු ලබන පාර්තොෂික දීමනා , එම වෙන්කිරීම් ගිණුමට හර කළ යුතු වුවත් , 2010 වර්ෂය තුල ගෙවූ රු. 91,440 ක් වර්ෂයේ ආදායම් වියදම් ගිණුමට හර කර තිබුණි. එමෙන්ම, 1983 අංක 12 දරන පාර්තෝෂක ගෙවීමේ පනත ප්‍රකාර ප්‍රතිපාදිත පාර්තෝෂික දීමනා අනාගත වගකීම්වලට මුහුණ දීමට හැකි වන පිණිස ආයෝජනය කර නො තිබුණි.

1.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

---------------------------------------

ස්ථාවර වත්කම් ලේඛණයක් පවතවා නො තිබුණු බැවින් සභාව සතු පිරිවැය රු.6,170,293 ක් වූ ස්ථාවර වත්කම්වල නිවැරැදතාව හා ඒවා ස්ථානගත කිරීම් පිළිබඳ නිසි පරිදි පරීක්ෂා කළ නො හැකි විය.

1.2.4 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

-------------------------------------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති, රීති,රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) පනත් | |
| (i) 1971 අංක 38 දරන මුදල් පනත | |
| 8 (1) වගන්තිය | වර්ෂය ආරම්භවීමට තෙ මසකට පෙර කෙටුම්පත් අයවැය ලේඛණය අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගත යුතු වුව ද , 2010 වර්ෂය සඳහා වූ අයවැය ඇස්තමේන්තුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර තිබුණේ 2010 නොවැම්බර් 23 දින දී ය. |

(ආ) චක්‍රලේඛ

-----------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය

| | | |
|---|---|---|
| (i) | 5.1.2 උප ඡේදය | පූර්ව තෙ වර්ෂයෙහි මෙහෙයුම් ප්‍රතිඵල පිළිබඳ සමාලෝචනයක් 2010-2014 කාල සීමාවට සකස් කළ සංයුක්ත සැලසුමෙහි අන්තර්ගත ව නො තිබුණි. එමෙන්ම, මුදුන් පමුණුවාගත යුතු ඉලක්කයන් හි මූල්‍යමය අගයන් දක්වා නො තිබුණු බැවින් වාර්ෂක ප්‍රගතිය මූල්‍යමය වශයෙන් ඇගැයීමට නො හැකි විය. |
| (ii) | 5.1.3 උප ඡේදය | පාලක මණ්ඩලය විසින් අනුමත කරන ලද යාවත්කාලීන කළ සංයුක්ත සැලැස්ම ඊ ලඟ මුදල් වර්ෂය ආරම්භ වීමට දින 15 කට පෙර රේඛීය අමාත්‍යාංශය, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව හා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් , ඒ අනුව කටයුතු කර නො තිබුණි. |
| (iii) | 5.2.6 උප ඡේදය | සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැයගත ආදායම් වියදම් ප්‍රකාශනයක් හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනයක් සහ සමාලෝචිත වර්ෂය අවසන් දිනට අයවැයගත ශේෂ පත්‍රයක් පිළියෙල කර අයවැය ලේඛණය සමඟ ඉදිරිපත් කර නො තිබුණි. |
| (iv) | 6.5.1 උප ඡේදය | මුදල් වර්ෂය අවසාන වී දින 60 කට පෙර කෙටුම්පත් වාර්ෂික වාර්තා හා ගිණුම්, රේඛීය අමාත්‍යාංශයට හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට පිටපතක් සහිත ව විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවත් , 2005 වර්ෂයේ සිට 2011 ජුනි මස දක්වාමත් ඒ අනුව කටයුතු කර නො තිබුණි. |
| (v) | 7.4.2 උප ඡේදය | ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කමිටුවක් ජාතික සභාව තුල ස්ථාපිත කර නොතිබුණි. |

2. මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය

---------------------------------------

2.1 මූල්‍ය සමාලෝචනය

----------------------

2.1.1 මූල්‍ය ප්‍රතිඵලය

------------------

සමාලෝචිත වර්ෂය තුල සභාවේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.1,563,052 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපව ඉකුත් වර්ෂයේ ඌනතාව රු.570,172 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.2,133,224 ක වාසිදායක තත්ත්වයක් පෙන්නුම් කෙරිණ. ඉකුත් වර්ෂයට සාපේක්ෂ ව සමාලෝචිත වර්ෂය තුල සේවක පාරිශ්‍රමික හා සංවර්ධන ව්‍යාපෘති වියදම් රු. 2,993,061 කින් වැඩි වී තිබුණ ද, රජයේ පුනරාවර්තන හා ප්‍රාග්ධන දායකය රු. 5,881,118 කින් වැඩි වී තිබීම මෙම වාසිදායක විචලනයට හේතු වී තිබුණි.

2.2 මෙහෙයුම් සමාලෝචනය

----------------------------

2.2.1 කාර්ය සාධනය

------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) සභාවේ මූලික අරමුණ වූ මානව සම්පත් සංවර්ධනය සඳහා වැය කළ මුදල, මුළු පුනරාවර්තන වියදමේ ප්‍රතිශතයක් ලෙස ඉතා අඩු අගයක් ගෙන තිබුණි. විස්තර පහත පරිදි ය.

| වර්ෂය | මුළු පුනරාවර්තන වියදම | මානව සම්පත් සංවර්ධන වැය | මුළු පුනරාවර්තන වියදමේ ප්‍රතිශතයක් ලෙස මානව සම්පත් සංවර්ධන වැය |
|---|---|---|---|
| | රු. | රු. | (%) |
| 2005 | 5,152,941 | 844,454 | 16.4 |
| 2006 | 5,868,600 | 692,147 | 11.8 |
| 2007 | 6,086,767 | 535,632 | 8.8 |
| 2008 | 6,728,939 | 659,801 | 9.8 |
| 2009 | 8,675,394 | 1,540,029 | 17.7 |
| 2010 | 12,423,287 | 3,378,959 | 27.2 |

2010 වර්ෂය තුල දී මානව සම්පත් සංවර්ධන වැය ලෙස දරා තිබුණු රු.3,378,959 තුල එක් ව්‍යාපෘතියක් වෙනුවෙන් පමණක් කළ පුවත්පත් හා විද්‍යුත් මාධ්‍ය ප්‍රචාරණයක් සඳහා රු.2,406,016 ක් ඇතුළත් වී තිබුණි. එම වියදම හැර මුළු පුනරාවර්තන වියදමට සාපේක්ෂකව මානව සම්පත් සංවර්ධන වැය ප්‍රතිශතය 7.8 % ක අවම අගයක් විය.

(ආ) දත්ත බැංකුවක් පිහිටුවීම

---------------------------

1997 අංක 18 දරන මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව පනතේ 16 වැනි වගන්තියෙ හි සඳහන් දත්ත බැංකුවක් පිහිටුවීමේ අරමුණ ඉටු කර ගැනීම සඳහා , දීප ව්‍යාප්ත ව විවිධ කුසලතාවන්ගෙන් යුතු පුද්ගලයින්ගේ තොරතුරු රැස් කර ගැනීම සඳහා ප්‍රථම නියමු සමීක්ෂණය ලෙස කඩුවෙල මාලඹේ උතුර ග්‍රාම නිලධාරි වසම තෝරා ගෙන එය 2010 මාර්තු 21 දින පවත්වා තිබුණි. නමුත් විගණිත දින වූ 2011 මැයි 09 දින වන විට ප්‍රථම නියමු සමීක්ෂණය පවත්වා වර්ෂයකට අධික කාලයක් ගත වී තිබුණ ද, එම අරමුණ ඉටු කර ගැනීම සඳහා වෙනත් කිසිදු පියවරක් ගෙන නො තිබුණි.

(ඇ) පාඨමාලා හැරයන සිසුන් පිළිබඳ සමීක්ෂණය

-----------------------------------------------

වෘත්තීය පුහුණු අධිකාරිය, ජාතික ආධුනිකත්ත්ව හා කාර්මික පුහුණු අධිකාරිය සහ කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව යන ආයතන හා සම්බන්ධ වී පාඨමාලා හදාරන සිසු සිසුවියන් අතරමග එම පාඨමාලා හැර යාමට හේතුව පිළිබඳ ව සමීක්ෂණයක් සිදු කර වාර්තාවක් ලබා ගැනීමට 2010 ජනවාරි 01 දින විශ්ව විද්‍යාල මහාචාර්යවරයෙකු සමඟ ගිවිස ගෙන තිබුණි. ගිවිසුම් කොන්දේසි පරිදි අදාල වාර්තාව 2010 අප්‍රේල් 10 දින හෝ ඊට පෙර සභාවට භාර දිය යුතු වුව ද , 2011 ජනවාරි 05 දින කෙටුම්පත් වාර්තාවක් පමණක් ඉදිරිපත් කර තිබුණු අතර අවසාන වාර්තාව 2011 මැයි 09 විගණිත දින වන විටත් භාර දී නො තිබුණි. මේ සඳහා වූ රු. 400,000 ක ප්‍රතිපාදනයෙන් 2010 වර්ෂය තුල දී රු. 76,875 ක් වැය කර තිබුණි.

(ඈ) එෆ් - 3 වැඩසටහන

----------------------

ඉහත වැඩසටහන අපොස උසස් පෙළ හා සාමාන්‍ය පෙළ විභාග අසමත් වී අතරමංවන සිසුන් , විශේෂ වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහනක් මගින් ක්ෂණික පුහුණුවක් ලබා දී රැකියාගත කිරීම සඳහා ගරු අමාත්‍යතුමාගේ නියෝග මත ආරම්භ කළ ව්‍යාපෘතියක. ඒ පිළිබඳ කරනු ලැබූ විගණනයේ දී අනාවරණය වූ කරුණු පහත පරිදි විය.

(i) 2010 දී ඉලක්කගත සිසුන් සංඛ්‍යාව 23,420 ක් වුවත් සහභාගීත්වය සිසුන් 9,737 ක් හෙවත් 41.58 % ක් පමණක් විය.

(ii) අපේක්ෂා කළ පරිදි සිසුන් 87,856 දෙනෙකුට 2011 වර්ෂයේ පළමු තෙ මස තුල දී පුහුණුවක් ලබා දී රැකියාගත කිරීමක් සිදු වී නො තිබුණු අතර යටත් පිරිසෙයින් පළමු පුහුණුවට සහභාගී වූ සිසුන් 9,737 දෙනාගේ වර්තමාන ප්‍රගතිය කෙබඳු ද යන්න 2011 මැයි 10 විගණිත දිනය වන විටත් පසු විපරම් කිරීමට පියවර ගෙන නො තිබුණි.

(ii) 2010 දෙසැම්බර් සිට 2011 අප්‍රේල් දක්වා මෙම ව්‍යාපෘතය සඳහා දරන ලද මුළු වියදම රු. 5,601,870 ක් වූ අතර ඉන් ප්‍රචාරණය වෙනුවෙන් පමණක් රු. 5,066,419 ක වැය කර තිබුණි. එය සමස්ත වියදමට සාපේක්ෂව 90% ක ප්‍රමාණාත්මක අගයක් විය. පුහුණු වැඩසටහන් සඳහා දරා තිබුණේ 10% ක් හෙවත් රු.535,451 ක් පමණි.

2.2.2 අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

-----------------------------

නිරීක්ෂණය වූ කරුණු පහත පරිදි ය.

(අ) 1997 අංක 18 දරන මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව පනතේ 3(1) වගන්තිය ප්‍රකාර ව සභාව සාමාජිකයින් 20 දෙනෙකුගෙන් සමන්විත යුතු වුවත් මුදල් හා ක්‍රම සම්පාදන විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා ඉහත වගන්තිය පරිදි අදාල පත් කිරීමට පියවර ගෙන නො තිබුණු අතර සාමාජික සංඛ්‍යාව ද 18 දෙනෙකු දක්වා සීමා වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුල පාලක මණ්ඩල රැස්වීම් 03 ක් පමණක් පවත්වා තිබුණි.

2.2.3 ක්‍රියාකාර සැලැස්ම

----------------------

2010 වර්ෂය සඳහා ව ක්‍රියාකාර සැලැස්ම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර තිබුණේ 2010 නොවැම්බර් 23 දින දී ය. එනම් සමාලෝචිත වර්ෂය අවසන් වීමට මාසයක් තිබිය දී ය.

2.2.4 අභ්‍යන්තර විගණනය

-----------------------

සභාව තුල අභ්‍යන්තර විගණන ඒකකයක් නො පැවතුණු අතර රේඛීය අමාත්‍යාංශය වූ යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය මගින් සභාවේ කටයුතු විගණනයට භාජනය කර නො තිබුණි.

2.2.5 අයවැය ලේඛනමය පාලනය

----------------------------

පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

සමාලෝචිත වර්ෂයේ අයවැයගත වියදම් හා තථ්‍ය වියදම් අතර විචලනයන් සලකා බැලීමේ දී වියදම් අයිතම 06 ක් සම්බන්ධයෙන් රු. 4,108,870 ක විචලනයක් පෙන්නුම් කෙරුණි. මේ අනුව අනුමත කරන ලද වාර්ෂික අයවැය ඇස්තමේන්තුව ඵලදායි මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදා ගෙන නො තිබුණු බව නිරීක්ෂණය විය.

3. පද්ධති හා පාලන

-------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර සභාවේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කල යුතු වේ.

(අ) සැපයුම් හා සේවා මිලදී ගැනීම

(ආ) සංයුක්ත හා ක්‍රියාකාර සැලැසුම් පිළියෙල කිරීම

(ඇ) වාර්ෂික වාර්තා සභාගත කිරීම

(ඈ) අභ්‍යන්තර විගණනය